රාජ්‍ය සේවා කොමිෂන් සභාව

සුරාබදු කොමසාරිස් ජනරාල් මගින්,
සියළුම සුරාබදු අධිකාරිවරුන් වෙත.

**<u>ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ සහකාර සුරාබදු කොමසාරිස් තනතුරට උසස් කිරීම</u>**

සුරාබදු දෙපාර්තමේන්තුවේ පුරප්පාඩු වී පවතින සහකාර සුරාබදු කොමසාරිස් තනතුරු තුනක් (03) සඳහා සුදුසුකම්ලත් සුරාබදු අධිකාරිවරුන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. වැටුප් ක්‍රමය :

2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හි විධි විධානයන්ට අනුව SL-1-2016 වැටුප් පරිමාණය එනම්, 47,615 – 1,335 X 10 – 1,630 X 8 – 2,170 X 17 – 110,895/= (මාසික) මෙම තනතුරට හිමිවන අතර එහි 8 වන පියවර මෙම තනතුරේ ආරම්භක වැටුප් පියවර වේ.

සටහන :- 2020.01.01. දින දක්වා වැටුප ගෙවනු ලබන්නේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හි 2 වන උපලේඛනය පරිදි වේ.

2. වයස් සීමාව: අදාළ නොවේ.

3. සපුරාලිය යුතු සුදුසුකම්:

3.1. සුරාබදු අධිකාරි තනතුරෙහි ස්ථිර කර තිබීම

3.2. සුරාබදු අධිකාරි තනතුරට නියමිත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත්ව තිබීම.

3.3. අදාල මට්ටමේ අනෙකුත් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබාගෙන තිබීම

3.4. පූර්වාසන්න වසර 05ක් තුල සුරාබදු අධිකාරි තනතුරේ සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම.

3.5. ඉල්ලුම් කරන දිනට පූර්වාසන්න වසර 5 තුළ සියලුම වැටුප් වර්ධක උපයාගෙන තිබීම.

3.6. ඉල්ලුම් කරන දින සිට පූර්වාසන්න වසර පහක (05) කාලයක් තුළ අවවාද කිරීමක් හැර විනයානුකූල දඬුවමකට භාජනය වී නොතිබිය යුතුයි.

4. උසස් කිරීමේ ක්‍රමය

ඉහත සුදුසුකම් සපුරන ලද අයදුම්කරුවන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් පහත සඳහන් ලකුණු පරිපාටිය යටතේ යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයකට ලක් කර එහිදී ලබා ගන්නා ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව පවත්නා පුරප්පාඩු වලට සුදුස්සන් තෝරා ගනු ලැබේ.

සුරාබදු අධිකාරිවරුන් සහකාර සුරාබදු කොමසාරිස් තනතුරට උසස් කිරීමට අදාළ යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා වූ ලකුණු පරිපාටිය.

| ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ සහකාර සුරාබදු කොමසාරිස් තනතුරට උසස් කිරීම සඳහා ලකුණු ලබා දෙන නිර්ණායක | එක් එක් ශීර්ෂය යටතේ ලබා දෙන උපරිම ලකුණු | මුළු ලකුණු |
|---|---|---|
| 1. සේවා පලපුරුද්ද සඳහා ලකුණු<br>(සුරාබදු අධිකාරි තනතුරෙහි වසර 05ක සේවා කාලයෙන් පසු එළඹෙන සක්‍රිය හා සතුටුදායක එක් වසරක සේවා කාලයට ලකුණු 05 බැගින්) | 50 | 50 |
| 2. කාර්ය සාධන ඇගයීම සඳහා (පූර්වාසන්න සක්‍රිය හා සතුටුදායක වසර 05 ක සේවා කාලය සඳහා)<br>I. විශිෂ්ඨ - (ලකුණු 04)<br>II. සාමාන්‍ය ප්‍රමාණයට වඩා ඉහළ - (ලකුණු 03)<br>III. සතුටුදායකයි - (ලකුණු 02) | 20 | 50 |
| 3. උසස් අධ්‍යාපන සුදුසුකම්<br>අදාළ ක්ෂේත්‍රයේ<br>I. පශ්චාත් උපාධි - (ලකුණු 10)<br>II. පශ්චාත් උපාධි ඩිප්ලෝමා - (ලකුණු 05)<br>සැ.යු. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ ආයතනයකින් ලබා ගත් පශ්චාත් උපාධිය හෝ පශ්චාත් උපාධි ඩිප්ලෝමා සඳහා (ඉහළම සුදුසුකමට පමණක් ලකුණු ලබාදේ.) | 10 | |
| 4. වෘත්තීය පුහුණු / විශේෂ පුහුණු<br>(දෙපාර්තමේන්තුවේ රාජකාරි කටයුතුවලට අදාළව ලබා ඇති විශේෂ වෘත්තීය පුහුණු සහතිකයකට ලකුණු 01 බැගින්)<br>(රජයේ පිළිගත් ආයතනයකින් ලබා ගත් සුදුසුකමක් විය යුතුය.) | 05 | |
| 5. ප්‍රශංසා<br>මෙම දෙපාර්තමේන්තුවට අදාළ රාජකාරි සම්බන්ධයෙන් දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ අදාළ අමාත්‍යාංශ ලේකම් වෙතින් පොදු 230b ආකෘතිය අනුව ලබා ගත් එක් ප්‍රශංසාවකට ලකුණු 02 බැගින් | 10 | |
| 6. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ ඇගයීම සඳහා<br>I. නායකත්වය (ලකුණු 01)<br>II. සන්නිවේදන කුසලතා (ලකුණු 01)<br>III. වෘත්තීය ආචාරශීලී බව (ලකුණු 01)<br>IV. ආත්ම විශ්වාසය (ලකුණු 01)<br>V. තීරණ ගැනීමේ හැකියාව/විචක්ෂණශීලී බව (ලකුණු 01) | 05 | |
| | | 100 |

ඉහත සුදුසුකම් තහවුරු කිරීම සඳහා අදාළ සහතිකපත්‍ර ඉදිරිපත් කළ යුතුය.